# මොරවක කැඩුම් බිඳුම් වෙදකම

පාරම්පරික වෛද්‍ය මාග්‍රට් පට්ටිවිදාන

බණ්ඩාරහේන, පාලුගම, දොම්පෙ ලිපිනයෙහි පදිංචි ව සිටි දොන් ලුවිස් පට්ටිවිදාන වෙදමහතාගේ දියණිය වන මාග්‍රට් පට්ටිවිදාන වන මම "කොටිකාවත්තේ මොරවක වෙද නෝනා" නමින් ප්‍රකට ව කැඩුම් බිඳුම් වෛද්‍ය කර්මයෙහි නිරත ව සිටිමි. පන්නිපිටියේ දෙපානම විසූ මොරවක පන්නිපිටිය වෙද පරම්පරාවේ විලියම් වෙද මහතාගේ ඥාතිවරයෙකු වන මගේ පියා විළියම් වෙද මහතාගේ පළමු සහ අවසාන ගෝලයා වූ අතර ඔහු විසින් මා වෙත මෙම වෛද්‍ය කර්මය පරම්පරාවෙන් උරුම කර දී තිබේ. කැඩුම් බිඳුම් වෙදකමේ දී සුවය ලැබීමට ගතවන කාලය කුඩා දරුවකුට නම් දින 14ක් ද, තරුණ වයසේ අයකුට නම් මාස 1 1/2ක් ද වැඩිහිටියකුට නම් මාස 2ක් හෝ 2 1/2ක් පමණ ද වේ. අස්ථියක් බිඳීම(භග්න) පිළිබඳ සැලකීමේ දී, හර අතට සිදු වන අස්ථි භග්නයක් නැවත පෑස්සීම එතරම් පහසු නොවේ. හන්දියක් පැන ඇති අවස්ථාවක නැවත සන්ධි කිරීම අපහසු නොවන නමුත්, සන්ධිය ඇතුළතින් බිඳීමට ලක් ව ඇති විට එය නැවත පෑස්සීම අසීරු ය.
අතක අස්ථි භග්නයක් සිදුව ඇති බවට ස්ථිර ව තහවුරු කර ගත් පසු අප විසින් ම සකස් කර ගත් විශේෂ තෙලක් ආලේප කර අස්ථිය හෝ සන්ධිය නිවැරදි පිහිටුමේ තබාගෙන පතුරු තබා වෙලීම සිදු කරයි.

ඉන් පසු පිළිවෙළින් දින හතක් දිනපතා පතුරු ගලවා උණුසුම පිටවීමට මිනිත්තු 10ක් 20ක් පමණ තබා, නැවත පළමු පත්තුව ගල්වා පතුරු තබා බැඳීම සිදු කළ යුතුය. එසේ උණුසුම පිටවීමට ඉඩ ලබා නොදීමෙන් භග්න ස්ථානයේ දියපට්ටා ඇති වීමත්, මධුමේහ රෝගියෙක් නම් භග්න ස්ථානයේ පහසුවෙන් තුවාල ඇති වීමත් සිදු විය හැකි ය. මේ අතරතුර පිටගැස්ම සහ අනෙකුත් අතුරු ආබාධවලින් ආරක්ෂා වීමට සීතාරාම ගුලි, මහදළු අනුපානයෙන් බුද්ධරාජ කල්කය ආදී ඖෂධ ලබා දෙනු ලැබේ.

දින හතකට පසුව අප විසින් ම සකස් කර ගත් තවත් පත්තුවක් දින හතක් ආලේප කිරීමෙන් රෝගියාගේ අතෙහි වේදනාව සම්පූර්ණයෙන් ම නැති වී යයි. ඉන් පසු අප විසින් සකස් කළ තුන්වන පත්තුව යෙදීම සිදු කරයි. හතරවන පත්තුව ගෑම ආරම්භ කරන විට රෝගියාට අත පහළ දැමීමට, හැරවීමට, ඇඟිලි සෙලවීමට හැකියාව ලැබේ. ඉදිමුම ද  අඩු වී යයි. එහෙත් භග්නය සිදු වූ ස්ථානය තව දුරටත් ප්‍රවේශම් කර ගැනීම වැදගත් වන අතර සම්පූර්ණ සුවය ලැබෙන තුරු  රාත්‍රියට තෙල් බැඳීම කරගෙන යා යුතු වේ. බර ඉසිලීම කිසිසේත් ම නොකළ යුතු වේ.

හිස වැදීම නිසා ආබාධිත තත්වයට පත් ව ඇස් ඇරීමට පවා අපහසු අවස්ථාවක දහවල් කාලයේ විශේෂ පත්තුවක් හිසට දමා, තෙල් ගැල්වීම සිදු කරයි. රෝගියාට ස්නානය, මොළය වෙහෙසවන කටයුතුවල යෙදීම නුසුදුසු වන අතර, කෂාය දීමත්, පුහුල් මල් නස්න කිරීමත් සිදු කරයි. කොස්, වම්බටු, මෑ කරල්, මුං ඇට, මුකුණුවැන්න, අඟුණ ආදී ආහාර සියලුම ආකාර කැඩුම් බිඳුම් රෝගීන්ට අහිතකරය. කැඩුම් බිඳුම් වෙදකමේ දී තැල්ම තදින් වෙලා තිබීම නිසා වේදනාව, ඉදිමුම, ආදී තත්ත්ව ඇති විය හැකි බැවින් ඉතා කල්පනාකාරී විය යුතු ය. තැල්ම ඇල් දියෙන් තෙමීම දිගුකලක් සිදු වීමෙන් එය ගෙඩියක් බවට පත් විය හැකි ය. එවැනි ගෙඩියක් සහිත ව පැමිණෙන රෝගියකුට පළමු ව  නාඩි බලා, දළු අනුපාන ලබා දී, ගෙඩිය දිය වී යාමටද පත්තුවක් ආලේප කිරීම අප විසින් සිදු කරනු ලැබේ. ගෙඩිය දරුණු ලෙසට පැසවා පිපිරී ගියේ නම්, ප්‍රවේශමෙන් සැරව බැහැර කර බෙහෙත් වැටියක් සකසා තුවාලය තු ට දමා ප්‍රතිකාර කළ යුතු ය. මධුමේහ රෝගියෙක් නම් සුදුසු ආහාර පිළිබඳ ව වැඩියෙන් සැලකිලිමත් විය යුතු ය. රෝගියා සිටින පරිසරයේ පවිත්‍ර බව පිළිබඳ ව ත් විශේෂ සැලකිල්ලක් දැක්වීම අවශ්‍ය වේ.

උළුක්කුවක් ඇති වූ විටෙක මතුරා ගත් තෙල් බැඳ පසුව දින හතක් මැල්ලුමක් බැඳීමට ලබා දෙනු ලැබේ. එමඟින් දින හතකින් උළුක්කුව සම්පූර්ණයෙන් ම සුව කිරීමේ හැකියාව අප වෙද පරපුර සතුව පවතියි.